රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 12/2005(VIII)

මගේ අංකය : EST-6/04/INS/1010
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.10.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් සඳහා ක්‍රියාත්මක අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ වූ ප්‍රතිලාභ තවදුරටත් පුළුල් කිරීම**

2016.04.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(VI) හා 2017.10.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(VII) හි විධිවිධාන කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. 2017.10.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(VII) න් සංශෝධිත 2016.04.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(VI) හි 04 වන ඡේදයේ සඳහන් පරිදි, 2016.01.01 දිනට පසුව විශ්‍රාම ගන්නා ලද රාජ්‍ය නිලධරයන් සඳහා ක්‍රියාත්මක වන අග්‍රහාර රකවරණ රක්ෂණ ක්‍රමයේ ප්‍රතිලාභ 2016.01.01 දිනට පෙර විශ්‍රාම ලැබූ සියලුම රජයේ නිලධරයන්ට ද ලබා ගැනීමට හැකි වන පරිදි එම යෝජනා ක්‍රමය පුළුල් කිරීමට 2020.07.22 සහ 2021.08.30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම්වල දී තීරණය කර ඇත.

03. ඒ අනුව වයස අවුරුදු 70ට අඩු විශ්‍රාමිකයෙකුගෙන් රු.400/-ක මාසික වාරික මුදලක් හා වයස අවුරුදු 70ට වැඩි විශ්‍රාමිකයෙකුගෙන් රු.600/-ක මාසික වාරික මුදලක් යටතේ හඳුන්වාදෙන අග්‍රහාර රකවරණ රක්ෂණ යෝජනා ක්‍රමය ඇමුණුම 01හි කොන්දේසි හා නියමයන්ට යටත්ව ඇමුණුම 02හි දැක්වෙන ප්‍රතිලාභ වෙනුවෙන් බලපැවැත් වේ.

04. මෙම රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා දායක වීමට මනාපය පළ නොකරන 2016.01.01 දිනට පෙර විශ්‍රාමගත් විශ්‍රාමිකයන් තම අකමැත්ත විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව මෙම චක්‍රලේඛය නිකුත් කළ දින සිට සති දෙකක කාලයක් තුළ දැන්විය යුතු ය. එම කාලය තුළ දී ඒ සඳහා ප්‍රතිචාර නොදක්වන විශ්‍රාමිකයන් මෙම අග්‍රහාර යෝජනා ක්‍රමයට මනාපය පළ කළා සේ සලකා කටයුතු කරනු ලබන අතර පසුව මෙම මනාපය ඉවත් කර ගැනීමට ඉඩ දෙනු නොලැබේ.

05. මුදල් අමාත්‍යාංශයේ සහ ජාතික රක්ෂණ භාර අරමුදලේ එකඟතාව ඇතිව අදාළ යෝජනා ක්‍රමය පිළිබඳ පරිපාලන විධිවිධාන ඇතුළත් උපදෙස් චක්‍රලේඛයක් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ඇත.

06. මෙම චක්‍රලේඛ විධිවිධාන 2021.11.01 දින සිට ක්‍රියාත්මක වේ.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

**<u>සංශෝධිත අග්‍රහාර රැකවරණ විශ්‍රාමික රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළ කොන්දේසි හා නියමයන් පහත පරිදි වේ.</u>**

1. රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයට අයත් සියලුම විශ්‍රාමිකයන් සඳහා මෙම රක්ෂණ ක්‍රමය අදාළ වීම.

2. සංශෝධිත මෙම රක්ෂණ ක්‍රමය මඟින් වයස අවුරුදු 70ට අඩු විශ්‍රාමිකයෙකුගෙන් රු.400/-ක මාසික වාරික මුදලක් හා වයස අවුරුදු 70ට වැඩි විශ්‍රාමිකයෙකුගෙන් රු.600/-ක මාසික වාරික මුදලක් යටතේ ක්‍රියාත්මක වීම.

3. විශ්‍රාමිකයින් සඳහා ජීවිතාන්තය දක්වා ම මෙම රක්ෂණාවරණ ප්‍රතිලාභ හිමිවීම.

4. විශ්‍රාමික රාජ්‍ය නිලධරයන්ගේ දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් අයකර මාසිකව ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ප්‍රේෂණය කිරීම.

5. විශ්‍රාමිකයන්ට පමණක් මෙම රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ හිමිවන අතර, ඔවුන්ගේ කලත්‍රයාට, අනත් දරුවන්ට හෝ ආබාධිත දරුවන් හට ප්‍රතිලාභ හිමි නොවීම.

6. විශ්‍රාමිකයාගේ කලත්‍රයා ද දැනට රාජ්‍ය සේවයේ නිරත වන්නෙක් නම් රෝහල් ගතවීමක දී විශ්‍රාමිකයා මෙම රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ පමණක් හිමිකම් ඉල්ලුම් කළ යුතු ය.

7. ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් හඳුන්වා දී ඇති විශ්‍රාමිකයන් සඳහා වූ අයදුම්පත්‍රය මෙම රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාමිකයන් විසින් තම ප්‍රතිලාභ ලබාගැනීම සඳහා භාවිත කළ යුතු අතර, සාමාජිකයා විසින් ප්‍රතිලාභ ඉල්ලුම්පත්‍ර සත්‍ය හා නිවැරදි බවට ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මඟින් සහතික කර, රෝහලෙන් බැහැර වූ දින සිට දින 90ක් ඇතුළත පහත සඳහන් ලියකියවිලි සමඟ ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ඉදිරිපත් කළ යුතු ය.

   **(අ) පුද්ගලික රෝහලක රෝහල් ගතවීමක දී**

   - (i) රෝග විනිශ්චය කාඩ්පතෙහි සහතික කරන ලද පිටපත
   - (ii) රෝහලෙන් නිකුත් කරන ලද අවසාන බිල්පතෙහි මුල් පිටපත
   - (iii) මුදල් ගෙවීමට අදාළ ලදුපත්වල මුල් පිටපත්

   **(ආ) රජයේ රෝහලක රෝහල් ගතවීමක දී**

   - (i) රෝග විනිශ්චය කාඩ්පතෙහි සහතික කරන ලද පිටපත
   - (ii) රෝහල්ගත ව සිටින කාලයේ දී වෛද්‍ය නිර්දේශ මත සිදු කරන ලද වෛද්‍ය පරීක්ෂණ හා ඖෂධ වියදම්වලට අදාළ වූ ඖෂධ වට්ටෝරුවේ (Prescription) හා ලදුපත්හි මුල් පිටපත්

8. පුද්ගලික රෝහලකින් කරනු ලබන හෘදය, මොළය, වකුගඩු හා අක්මාව ආශ්‍රිත සැත්කම් සඳහා ඇප ආවරණ ලිපියක් ලබාගන්නේ නම් පහත සඳහන් ලියකියවිලි ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ඉදිරිපත් කළ යුතු ය.

   - (i) ප්‍රතිලාභියා විසින් ඇප ආවරණ ලිපියක් ලබාගැනීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලෙන් ඉල්ලුම් කිරීමේ ලිපිය
   - (ii) ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මඟින් සහතික කරන ලද අයදුම්පත්‍රය
   - (iii) අදාළ වෛද්‍ය නිලධාරී විසින් සහතික කොට ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ලබාදෙන ලිපිය හා පෞද්ගලික රෝහල මඟින් ලබාදෙනු ලබන තක්සේරු ලිපිය
   - (iv) ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද විශ්‍රාමික හැඳුනුම්පතෙහි පිටපතක්
   - (v) ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්
   - (vi) හිමිකමට අදාළ මුදල් රෝහල වෙත ඍජුව ගෙවීමට ප්‍රතිලාභියාගේ එකඟතාව පළ කරන ලද ලිපිය

# 2021.06.01 දිනට සංශෝධිත අග්‍රහාර රක්‍ෂණ විශ්‍රාමික රක්ෂණ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ සටහන

(අ) ජීවිත කාලය තුළ සාමාන්‍ය ලෙස ලබාගත හැකි ප්‍රතිලාභ

| අනු අංකය | ප්‍රතිලාභ වර්ග හා වටිනාකම (රුපියල්) | උපරිම වටිනාකම (රුපියල්) |
|---|---|---|
| 01 | **පුද්ගලික රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබා ගැනීමේ දී**<br>• කාමර ගාස්තු සඳහා රු.30,000/-<br>(දිනකට රු.3,000/- බැගින් උපරිම දින 10ක් සඳහා)<br>• ඖෂධ, ශල්‍ය හා හෙද වියදම් රු.50,000/-<br>• වෛද්‍ය ගාස්තු රු.20,000/-<br>• වෛද්‍ය පරීක්ෂණ සඳහා රු.20,000/- | 120,000/-<br>(එක් සිද්ධියක් සඳහා) |
| 02 | **පුද්ගලික ආයුර්වේද රෝහලක ප්‍රතිකාර සඳහා**<br>• කාමර ගාස්තු සඳහා රු.10,000/-<br>(දිනකට රු.1,000/- බැගින් උපරිම දින 10ක් සඳහා)<br>• ඖෂධ, ශල්‍ය හා හෙද වියදම් රු.35,000/-<br>• වෛද්‍ය ගාස්තු රු.15,000/-<br>• වෛද්‍ය පරීක්ෂණ සඳහා රු.15,000/-<br>(පුද්ගලික ආයුර්වේද රෝහල දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී තිබිය යුතු ය. පුද්ගලික ආයුර්වේද මධ්‍යස්ථානවලින් ගන්නා ප්‍රතිකාර සඳහා ගෙවීම් කරනු නොලැබේ.) | 75,000/-<br>(වාර්ෂිකයට යටත්ව) |
| 03 | **(අ) රජයේ රෝහල් සඳහා**<br>රජයේ රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන්නේ නම් (වරකට උපරිම දින 10ක් සඳහා දිනකට රු.500/- බැගින් වසරකට උපරිම දින 20ක් සඳහා පමණි.)<br>• ඖෂධ වියදම්<br>• වෛද්‍ය පරීක්ෂණ සඳහා<br>(නේවාසිකව සිටි කාලපරිච්ඡේදයට අදාළව පමණක් බිල්පත් ප්‍රතිපූරණය කරනු ලබන අතර, ඒ සඳහා වෛද්‍ය නිර්දේශ හා බිල්පත්වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.)<br>**(ආ) රජයේ රෝහලේ (ගෙවන වාට්ටු සඳහා)**<br>• කාමර ගාස්තු රු.10,000/-<br>(දිනකට රු.1,000/- බැගින් උපරිම දින 10ක් සඳහා)<br>• ඖෂධ, ශල්‍ය හා හෙද වියදම රු.35,000/-<br>වෛද්‍ය ගාස්තු රු.15,000/-<br>වෛද්‍ය පරීක්ෂණ සඳහා රු.15,000/- | 5,000/-<br>50,000/-<br>20,000/-<br>75,000/-<br>(එක් සිද්ධියක් සඳහා) |

| | | |
|---|---|---|
| 04 | **රජයේ ආයුර්වේද රෝහලක ප්‍රතිකාර සඳහා**<br><br>රජයේ ආයුර්වේද රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන්නේ නම් (දිනකට රු.500/- බැගින් උපරිම දින 10ක් සඳහා)<br><br>(වසරකට උපරිම දින 20ක් සඳහා පමණි.) | 5,000/- |
| 05 | ඇසේ සුද ඉවත්කිරීමේ ශල්‍ය කර්මය (කාච සඳහා වන වියදම් ද ඇතුළත්ව) | 25,000/- |

සටහන : ඉහත 01 සිට 05 දක්වා වූ සිදුවීම්වලට අදාළ උපරිම සීමාවන්ට යටත් ව රක්ෂණ සාමාජිකයාගේ හිමිකම් සීමාව වසරකට උපරිමය රු.150,000/- ක් වේ.

**(ආ) ජීවිත කාලය තුළ එක් වරක් පමණක් ප්‍රතිපූර්ණය කළ හැකි විශේෂ ප්‍රතිලාභ පහත සඳහන් පරිදි වේ.**

| **අනු අංකය** | **ප්‍රතිලාභ වර්ගය** | **උපරිම වටිනාකම (රුපියල්)** |
|---|---|---|
| 01 | • Critical Heart Surgeries (including by-pass and angioplasty)<br>හෘදය ආශ්‍රිත වෙනත් සැත්කම්<br>• Implanting pacemaker - Single<br>• Implanting pacemaker - Double<br>• RF Ablation | 500,000/-<br><br>150,000/-<br>300,000/-<br>225,000/- |
| 02 | වකුගඩු බද්ධ කිරීම සඳහා | 500,000/- |
| 03 | මොළයේ ශල්‍යකර්ම සඳහා | 500,000/- |
| 04 | අක්මාව බද්ධ කිරීමේ ශල්‍යකර්මය සඳහා | 500,000/- |
| | පුද්ගලික රෝහලක සිදුකරනු ලබන හෘද, වකුගඩු, මොළය හා අක්මාව ආශ්‍රිත සැත්කම් සඳහා වන වියදම් ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් සෘජුව ම රෝහල වෙත ගෙවිය හැක. එවැනි අවස්ථාවක රෝහල් ගතවීමට පෙර ජාතික රක්ෂණ භාර අරමුදලෙන් ඇප ආවරණ ලිපියක් ලබාගත යුතු වේ.<br><br>ඉහත සඳහන් ශල්‍යකර්ම හැර පෞද්ගලික රෝහලක සිදුකරනු ලබන වෙනත් ශල්‍යකර්ම සඳහා වන වියදම් ගෙවීම ප්‍රතිලාභ රක්ෂණ යෝජනා ක්‍රමයේ සඳහන් අංක 01 අනුව ප්‍රතිපූරණය කරනු ලැබේ. | |
| 05 | පිළිකා රෝග සඳහා | 200,000/- |
| 06 | ශ්‍රවණ උපකරණ සඳහා (ජීවිත කාලය තුළ එක්වරක් පමණි.) | 50,000/- |